
# වැසි තත්ත්වය අද සිට ඉහළට

● ඉන්දික හේවාවිතාරණ



වායුගෝලයේ පවතින කැළඹීම නිසා බොහෝ ප්‍රදේශවල පවතින වැසි තත්ත්වය අද (14දා) සිට ඉදිරි දින කිහිපය තුළ ඉහළ යා හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

මේ අනුව අද නැගෙනහිර සහ ඌව පළාත්වලත් යාපනය,මුලතිව්, මාතලේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කවලත් විටින්විට වැසි ඇතිවන බවත්, වවුනියාව, කිලිනොච්චිය, මන්නාරම, අනුරාධපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල වැසි වාර කිහිපයක් ඇතිවිය හැකි බවත් එම දෙපාර්තමේන්තුව පෙන්වා දෙයි.

සෙසු ප්‍රදේශවල සවස 1.00න් පමණ පසු තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි බවත්, නැගෙනහිර, ඌව, බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් නුවරඑළිය, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලත් මිලිමීටර් 100ට වැඩි තද වැසි ඇතිවිය හැකි බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, දකුණු සහ ඌව පළාත්වල ඇතැම් ස්ථානවල උදෑසන කාලයේදී මීදුම් සහිත තත්ත්වයක් පැවතිය හැකි බවත්, ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළංවලින් සහ අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ජනතාවගෙන් ඉල්ලා සිටියි.

ත්‍රිකුණාමලය සිට මඩකලපුව සහ පොතුවිල් හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැකි බවත්, දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි බවත් එම දෙපාර්තමේන්තුව පෙන්වා දෙයි.

කොළඹ සිට මන්නාරම සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වාත්, හම්බන්තොට සිට පොතුවිල් දක්වාත් වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවලත් සුළඟේ වේගය විටින් විට පැයට කි.මී. 40-50 දක්වා වැඩි විය හැකි බවත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වැඩිදුරටත් පෙන්වා දෙයි.

පවතින වැසි තත්වය නිසා බදුල්ල, හම්බන්තොට, කළුතර. මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතලේ, මාතර, නුවරඑළිය, රත්නපුර යන දිස්ත්‍රික්වල පිහිටි කඳු ආශ්‍රිත ප්‍රදේශ නාය යෑම්වලට ලක්විය හැකි බව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සඳහන් කරයි.


මේ නිසා මෙම දිස්ත්‍රික්ක දහයේ කඳු ආශ්‍රිත ප්‍රදේශවල පදිංචිව සිටින ජනතාව නායයෑම් ලක්ෂණ පිළිබඳව අවධානය යොමු කර අවශ්‍ය කටයුතු කරන ලෙසද ඉල්ලා සිටියි.

දිස්ත්‍රික්ක 08කට ඇති වී තිබෙන අයහපත් කාලගුණ තත්ත්වය නිසා පවුල් 865කට අයත් පුද්ගලයන් 2250ක් පීඩාවට පත්ව තිබෙන අතර නිවාස 42කට හානි සිදුව තිබේ. පීඩාවට පත් පිරිසෙන් පවුල් 175කට අයත් පුද්ගලයන් 589 ක් ආරක්ෂිත ස්ථාන 11ක රඳවා ඇත.

# අධිවේගයේ ඉන්නා STF නිලධාරීන් 175දෙනා කුඩු මාෆියාව මර්දනයට

– මහජන ආරක්ෂක ඇමති

● දිනේෂ් සමරකෝන්



අධිවේගී මාර්ගවල ගිනි නිවීමට සහ ජීවිත ගලවා ගැනීමට යොදවා තිබෙන පොලිස් විශේෂ කාර්ය බළකායේ සාමාජිකයන් 175දෙනා ඉන් ඉවත් කර 'කුඩු මාෆියාව' මර්දනය කිරීම සඳහා සේවයේ යොදවන බව මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මහතා පැවසීය.

ස්ථාවර නියෝග 27/2 යටතේ ඊයේ (13දා) පාර්ලිමේන්තුවේදී විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා යොමු කළ ප්‍රශ්නයකට පිළිතුරු ලබාදෙමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

කෙසේ වෙතත් අධිවේගී මාර්ගවල පොලිස් නිලධාරීන් ඒ ආකාරයෙන්ම රාජකාරී කටයුතු කරන බවද සඳහන් කළ අමාත්‍ය ටිරාන් අලස් මහතා,

"එක් එක් අධිවේගී පිවිසුම් මාර්ගයේ සේවය කිරීම සඳහා පොලිස් විශේෂ කාර්ය බළකා භටයන් යොදවා නොමැති අතර, අධිවේගී මාර්ග පද්ධතියේ ගිනි නිවීම හා ජීවිත ගලවා ගැනීමේ රාජකාරී සිදුකරනු ලබයි. එම සියලු භටයන් අධිවේගී මාර්ග රාජකාරීවලින් ඉවත් කර ගැනීමට රජය තීරණය කරලා තියෙනවා. විශේෂ කාර්ය බළකාය අධිවේගී මාර්ගයේ කරන එකම දේ මොනවා හරි රිය අනතුරක් වුණොත් ඒවාට කටයුතු කරනවා. නැත්නම් ගින්නක් ඇති වුණොත් ඒකට කටයුතු කරනවා.

පසුගිය මාස 11 කාලය තුළ 164 වතාවක් පමණක් මේ විශේෂ කාර්ය බළකා සාමාජිකයන්ව යොදවලා තියෙන්නේ. දවස් 330ක් ගත්තොත් එච්චරයි රාජකාරී කරලා තියෙන්නේ. මේ විශේෂ කාර්ය බළකායේ එතන ඉන්න 175ට අපි වියදම් කරනවා අවුරුද්දකට මිලියන 260ක් පමණ. නිකන් අධිවේගී මාර්ගයේ ඉන්නවා. මොනවා හරි ඇක්සිඩන්ට් එකක් වුණොත් කෝල් එකක් දුන්නම එතනට යනවා. නැත්නම් ඇවිල්ලා නිකන් ඉන්නවා. ඒ නිසා තමයි මම තීරණය කළේ, අපට විශේෂ කාර්ය බළකාය අවශ්‍යයි මේ කුඩු මාෆියාව නැති කරන්න. දැනටමත් කුඩු මාෆියාව නැති කරන්න විශේෂ කාර්ය බළකායේ සාමාජිකයන් දෙදහස් ගාණක් අඩුයි. ඒ නිසා තමයි මේ 175 එළියට ගන්න හදන්නේ. ඒත් පොලීසිය එතන රාජකාරී කරනවා" යනුවෙන් සඳහන් කළේය.

# IMF දෙවැනි වාරිකය ලෙස ඇ.ඩො.මි.330ක් මුදාහරී

## ආර්ථිකය ස්ථාවරවීමේ තාවකාලික ලකුණු පෙන්නුම් කරමින් පවතින බවත් කියයි

● ෂමිල පෙරේරා



ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විධායක මණ්ඩලය විසින් මාස 48ක විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ පළමුවැනි සමාලෝචනය සම්පූර්ණ කරමින්, විශේෂ ගැනුම් හිමිකම් (SDR) මිලියන 254ක්, එනම් ඇ.ඩො.මිලියන 330ක් පමණ ශ්‍රී ලංකාව වෙත මුදාහරින බව දන්වා තිබේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පෙන්වා දෙන්නේ, ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ එලදැරීමට පටන්ගෙන ඇති අතර, ආර්ථිකය ස්ථාවරවීමේ තාවකාලික ලකුණු පෙන්නුම් කරමින් පවතින බවය.

කෙසේ වෙතත්, මෑතකදී ප්‍රකාශයට පත්කරන ලද 'පාලන නිර්ණ වාර්තාවේ' ප්‍රධාන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට බලධාරීන්ගේ කැපවීම වැදගත් පියවරක් බව පෙන්වා දෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආර්ථිකය පිළිබඳ විශ්වාසය යළි ගොඩනැගීමට සහ වඩාත් ශක්තිමත් සහ සහභාගීත්ව ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා දූෂණය සම්බන්ධ අවදානම් කෙරෙහි පිළියම් යෙදීමට සහ වගකීම්සහගත බව ශක්තිමත් කිරීම සඳහා ස්ථිරසාර පියවර අත්‍යවශ්‍ය බවද අවධාරණය කරයි.

මෙසේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි 'පාලන නිර්ණයක් සිදුකළ පළමුවැනි ආසියානු රට ශ්‍රී ලංකාව ලෙස සැලකෙයි. එහිදී, මෙම වැඩසටහනෙහි පරාමිතිවලට අනුකූලව 2024 වර්ෂය තුළ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇතිකර ගැනීමට සහායවීම සඳහා ආදායම් ඉහළ නැංවීම වෙනුවෙන්, ආදායම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතින බවද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැඩිදුරටත් පවසා සිටියි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ පහසුකම යටතේ මේ දක්වා ශ්‍රී ලංකාව වෙත මුදාහරින ලද සමස්ත අරමුදල් ප්‍රමාණය විශේෂ ගැනුම් හිමිකම් මිලියන 508ක් හෙවත්, ඇ.ඩො.මිලියන 660ක් පමණ වෙයි.




අද

කර්තෘ මණ්ඩලය

ලිපිනය:
අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02.

දුරකථන:
2479670, 2479671

ෆැක්ස්:
2479668

විද්‍යුත් තැපෑල:
ada@wijeya.lk / adanewspaper@gmail.com

වෙළෙඳ දැන්වීම් අංශය:
011 2479 830

බෙදාහැරීමේ අංශය:
011 2479 625

දායකත්ව අංශය:
011-2479 626

අද

පාඨක අයිතීන් සුරැකීම

අද පුවත්පත ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම වෙත සහයෝගය දක්වයි.

මේ පුවත්පතෙහි සේවා කරන කර්තෘ ඇතුළු පත්‍රකලාවේදීන් සියලු දෙනම 'පාඨක අයිතීන් සුරැකීම' සහ පුවත්පත් පැමිණිලි කොමිසම මඟින් ක්‍රියාවට නංවන 'කර්තෘ සංසදයට' අදාල ආචාර ධර්ම සුරැකීමට නිබඳව බැඳී සිටිති. පුවත්පතේ පළකෙරෙන ප්‍රවෘත්තීයක් නිසා ඔබට සිදුවන යම් අපහසුතාවක් පිළිබඳ අප පුවත්පත දැනුම්වත් කිරීමට අවස්ථාව ඇත.

ඒ පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, 'ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම' වෙතද ඔබේ පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.

ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම
Press Complaints of Sri Lanka

96, කිරුළ පාර, කොළඹ 05.


| | |
|---|---|
| දුරකතනය | 5 353 635 |
| ෆැක්ස් | 5 335 500 |
| ඉමේල් | pccsl@pccsl.lk |
| වෙබ් | www.pccsl.lk |




# එළඹෙන වර්ෂයේ සිට ශිෂ්‍යත්වය සරල කරනවා

– අධ්‍යාපන ඇමති සුසිල් ප්‍රේමජයන්ත්

● නවෝද්‍යා පවනි



එළඹෙන වර්ෂයේ සිට පවතින අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන වෙනස්කම් කිහිපයක්ම සිදුකිරීමට නියමිත බවත්, 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය දැනට පවත්නා තත්ත්වයට වඩා සරල කිරීමට ඒ යටතේ අපේක්ෂා කරන බවත් අධ්‍යාපන අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත් මහතා පැවසීය. එහිදී සිසුන්ගේ සාක්ෂර හැකියාව සහ අංකන හැකියාව මැන බැලීමට ප්‍රමුඛතාව ලබාදෙන බවද හෙතෙම සඳහන් කළේය.

2023 වර්ෂයේ පැවැත්වූ පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ඉහළම ලකුණු ලබාගත් සිසුන් සහ 2022 වර්ෂයේ පවත්වන ලද අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිට ඉහළම ලකුණු ලබාගත් සිසුන් ඇගයීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශ පරිශ්‍රයෙහි පැවති උත්සවයට එක්වෙමින් අමාත්‍යවරයා මේ අදහස් පළ කළේය.

මෙහිදී වැඩිදුරටත් කරුණු දක්වමින් අමාත්‍යවරයා සඳහන් කළේ, ඉදිරියේදී විභාගවලින් ලකුණු සියයට සියයක් ගැනීම මත පමණක් සිසුන් ඇගයීම සිදු නොකරන බවයි.

සිසුන් පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ලබා ගන්නා ලකුණු මෙන්ම 4, 5 ශ්‍රේණි දෙක තුළ පන්ති කාමරයේදී සිදුකරන ඇගයීම්වලින් 30%ක් ලකුණු ලබාගත යුතු බවත්, මේ සඳහා සිසුන්ගේ පාසල් පැමිණීම අඛණ්ඩව පවත්වා ගත යුතු බවත් අමාත්‍යවරයා පෙන්වා දුන්නේය. මෙහිදී ගුරුවරුන් පක්ෂග්‍රාහීව කටයුතු කරනු ඇති බවට ඇතැම් දෙමවුපියන් විවේචන එල්ල කළ හැකි බවත්, එහෙත් එවැනි තත්ත්වයන්ට ඉඩක් නොමැති බවත් අමාත්‍යවරයා පැවසුවේය.

පාසල් තුළ පන්ති කාමරවල සිසුන් ඇගයීමට ලක් කරන අයුරු පාසල් මණ්ඩල මගින් අධීක්ෂණයට ලක්කරන බව පෙන්වා දුන් අමාත්‍යවරයා, හොඳම අධ්‍යාපනයක් ඇති රටක් ලෙස පිළිගැනෙන ෆින්ලන්තයේ පවා 9වැනි ශ්‍රේණිය තෙක් පාසල්වල යොදාගනු ලබන්නේ පන්තිකාමර මට්ටමින් කෙරෙන ඇගයීම් පමණක් බවද කීවේය. එරට පාසල් සිසුන් විභාග මගින් ඇගයීමට ලක්කරනු ලබන්නේ 9 ශ්‍රේණියේ සිට බවද අමාත්‍යවරයා පැවසීය.

# බාලවයස්කාර දැරියක් ගුවන්යානයේදී අපයෝජනය කළ විදේශිකයා අත්අඩංගුවට

● කටුනායක - ටී.කේ.ජී.කපිල

සෞදි අරාබියේ රියාද් නුවර සිට කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණෙමින් තිබූ ශ්‍රී ලන්කන් ගුවන් යානයක ගමන් ගත් ශ්‍රී ලාංකික කුඩා දැරියක් ලිංගික අතරවරයකට ලක් වීමෙන් පසු , එය සිදු කළ ඉන්දීය ජාතික ගුවන් මගියා ගුවන් යානා කාර්ය මණ්ඩලය විසින් අත්අඩංගුවට ගෙන කටුනායක ගුවන් තොටුපොළ පොලීසිය වෙත භාර දී තිබේ.

ඊයේ (13දා) උදෑසන 07.20ට සෞදි අරාබියේ රියාද් නුවර සිට කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණි ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ ගුවන් යානයක මෙම ලිංගික අතවරය සිදු වී තිබේ.

මොහු 49 හැවිරිදි ඉන්දීය ජාතික වඩු කාර්මික ශිල්පියෙකි . ඔහු මෙම ගුවන් යානයෙන් කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ යළිත් ඉන්දියාව වෙත වෙනත් ගුවන් යානයකින් පිටත්ව යාම සඳහා පැමිණෙමින් සිටි සංක්‍රමණික ගුවන් මගියෙකි.

සෞදි අරාබියේ රැකියාවක නිරත තම පියා බැලීමට ගොස් ආපසු පැමිණෙමින් සිටි අවිස්සාවේල්ල, ප්‍රදේශයේ පදිංචි මවක සහ ඇයගේ කුඩා දැරියන් දෙදෙනා ද මෙම ගුවන් යානයේ ගමන් ගනිමින් සිටියහ.

ඔවුන් අතරින් අවුරුදු 08යි මාස 10ක් වයසැති කුඩා දැරිය මෙසේ මෙම ඉන්දීය ජාතිකයා විසින් ලිංගික අතවරයකට ලක් කර තිබූ අතර, ඒ පිළිබඳව ගුවන් යානා කාර්යමණ්ඩලය වෙත පැමිණිළි කිරීමට මෙම මව පියවර ගෙන තිබුණි.

ඒ අනුව මෙම ගුවන් යානය කටුනායක ගුවන් තොටුපොළ වෙත ගොඩ බැස්සවීමෙන් අනතුරුව මෙම ඉන්දීය ජාතිකයා අත් අඩංගුවට ගෙන ගුවන් තොටුපොළ පොලීසිය වෙත භාර දීමට ගුවන් යානා කාර්ය මණ්ඩලය පියවර ගෙන තිබුණි.

මේ වනවිට අතවරයට පත් ශ්‍රී ලාංකික දැරිය සහ ඉන්දීය ජාතිකයා මීගමුව මහ රෝහල වෙත වෛද්‍ය පරීක්ෂණ සඳහා කටුනායක ගුවන් තොටුපොළ පොලීසිය විසින් යොමු කර තිබේ.

මෙම අත් අඩංගුවට ගැනීම සහ මේ පිළිබඳ වැඩිදුර විමර්ශන කටයුතු කටුනායක ගුවන් තොටුපොළ පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක මැල්කම් ජේත් මහතාගේ උපදෙස් සහ අධීක්ෂණය මත සිදු කරමින් පවතී.

# පාරිපාලන නිලධාරිනියට එරෙහිව ජාතික අක්ෂි රෝහලේ වෛද්‍යවරු අද වර්ජනයේ

● ඉන්දික හේවාවිතාරණ

කොළඹ, ශ්‍රී ලංකා ජාතික අක්ෂි රෝහලේ අද (14දා) උදෑසන 8.00 සිට සවස 4.00 දක්වා සංකේත එක්දින වැඩවර්ජනයක් සිදුකරන බවත්, එහෙත් හදිසි ප්‍රතිකාර සේවා පවත්වාගෙන යන බවත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සඳහන් කරයි.

එම රෝහලේ පාරිපාලන නිලධාරිනියගේ ක්‍රියා කලාපය නිසා සෞඛ්‍ය සේවකයන්ගේ කටයුතුවලට හා රෝගී සත්කාර සේවාවලට බලපෑම් සිදුවෙමින් තිබෙන බවද එම සංගමයේ මාධ්‍ය ප්‍රකාශක, වෛද්‍ය චමිල් විජේසිංහ මහතා සඳහන් කළේය.



මෙම නිලධාරිනියගේ ක්‍රියා කලාපය පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයට හා රෝහල් බලධාරීන් අවස්ථා කිහිපයකදී දැනුවත් කළද, මෙතෙක් අදාළ ගැටලුවලට විසඳුම් ලැබී නොමැති බවද හෙතෙම පවසා සිටියේය.

# හදිසි විදුලි බිඳවැටීම නිසා කොළඹ ජාතික රෝහලේ අක්‍රිය වූ පරීක්ෂණ යන්ත්‍ර 4න් 2ක් තවමත් අක්‍රියයි

## යන්ත්‍රවල විනාශ වූ කොටස් අලුත්වැඩියාවට වැයවන අධික මුදල ලංවිමෙන් අයකරගන්න

– පරිපූරක වෛද්‍ය වෘත්තීන්ගේ ඒකාබද්ධ බලමණ්ඩලය

● ඉන්දික හේවාවිතාරණ

පසුගිය 10වන දින සිදුවූ හදිසි විදුලි බිඳවැටීම හේතුවෙන් කොළඹ ජාතික රෝහලේ පරීක්ෂණ යන්ත්‍ර 04ක් බිඳවැටුණු බවත් ඉන් යන්ත්‍ර දෙකක් තවමත් ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී තිබෙන බවත් පරිපූරක වෛද්‍ය වෘත්තීන්ගේ ඒකාබද්ධ බලමණ්ඩලය සඳහන් කරයි.

හදිසි විදුලි බිඳවැටීම හේතුවෙන් ජාතික රෝහලේ MRI ස්කෑන් යන්ත්‍ර 3ක් සහ DSA යන්ත්‍රයක් බිඳවැටී ඇති අතර, මෙම යන්ත්‍රවලින් ඊයේ (13දා) වන විට DSA යන්ත්‍රය සහ නව බාහිර රෝගී අංශයේ තිබෙන MRI යන්ත්‍රය නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත්කර තිබෙන බවද සඳහන් කරයි.

එහෙත් අපස්මාර ඒකකයේ හා විශේෂිත ස්නායු ඒකකයේ තිබෙන MRI යන්ත්‍ර දෙක තවමත් ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී තිබෙන බවත් හදිසි විදුලි බිඳවැටීම නිසා යන්ත්‍ර 04ක කොටස් කිහිපයක් විනාශ වී තිබෙන බවද පෙන්වා දෙයි.

අදාළ කොටස් මිලදී ගැනීමට විශාල මුදලක් වැය වන බවත් මේ නිසා අදාළ මුදල විදුලිබල මණ්ඩලයෙන් අයකර ගන්නා ක්‍රමයක් සකස් කරන ලෙසට බලධාරීන්ගෙන් ඉල්ලා සිටින බවද සඳහන් කරයි.

කොළඹ ජාතික රෝහලේ MRI යන්ත්‍ර හතරක් පවතින බවත් මෙම යන්ත්‍ර මගින් පරීක්ෂණ සිදුකර ගැනීම සඳහා මාස 03ක පමණ පොරොත්තු ලේඛනයක් පවතින බවත් මේ වන විට යන්ත්‍ර දෙකක් බිඳ වැටී තිබෙන නිසා මෙම පොරොත්තු ලේඛන කාලය තවත් දීර්ඝ විය හැකි බවද සඳහන් කරයි.

# බාල ඖෂධ සිද්ධියට සම්බන්ධ අයව තරාතිරම නොබලා අත්අඩංගුවට ගන්න

## සැකකරුවන් යළි 27දා දක්වා රිමාන්ඩ්

**මාලිගාකන්ද මහේස්ත්‍රාත්ගෙන් CIDයට නියෝග**

● බුද්ධිමාල් රූබේරු

ප්‍රමිතියෙන් තොර ප්‍රතිදේහ එන්නත් රජයේ රෝහල්වලට බෙදාහැරීම මගින් රුපියල් කෝටි ගණනක වංචා කිරීම සහ රෝගී ජීවිත අනාරක්ෂිත තත්ත්වයකට පත් කිරීමේ සිද්ධියට රජයේ ඉහළ නිලධාරීන්ගේ සම්බන්ධයක් ඇති බවට තොරතුරු පෙනෙන්නට ඇතැයි පැවසූ මාලිගාකන්ද මහේස්ත්‍රාත් ලෝචනී අබේවික්‍රම වීරසිංහ මහත්මිය, ඔවුන් කුමන ආයතනයක කුමන තරාතිරමකට අයත් වුවත් වහාම අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙස රහස් පොලීසියට ඊයේ (13දා) නියම කළාය.

මෙම සැකකරුවන්ට අමතරව මෙම සිද්ධිය පාලනය කරන දෙතුන්දෙනා කවුරුන්ද? යනුවෙන් ප්‍රශ්න කළ මහේස්ත්‍රාත්වරිය, මෙම සිද්ධියට අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයාගේ ක්‍රියාකලාපය සැක සහිත භාවයක් ජනිත කර ඇතැයිද සඳහන් කළාය.

සැකකරුවන්ට ඇප නියම කරන ලෙස ඔවුන්ගේ නීතිඥවරුන් කළ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරමින් ඔවුන් ලබන 27වැනිදා තෙක් තවදුරටත් රිමාන්ඩ් භාරයට පත් කළ මහේස්ත්‍රාත්වරිය, මෙම සිද්ධියෙන් අගතියට පත් වී සිටින්නේ, රජයට බදු ගෙවන සියලු ජනතාව වනවිට ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනීසිටීමට නීතිඥවරුන්ට අයිතියක් ඇති බව පෙන්වා දෙමින් මෙම සිද්ධිය පැමිණිලි කළ අල්ලස දූෂණය හා නාස්තියට එරෙහි පුරවැසි බලය සංවිධානය සහ සිවිල් සංවිධාන එකතුමුතුව වෙනුවෙන් ජනාධිපති නීතිඥ නලින්ද ඉන්ද්‍රතිස්ස මහතාට පෙනීසිටීමට අවසර දුන්නාය.

ස්නායු රෝගීන් සඳහා භාවිත කරන ඉමියුනෝග්ලෝබින් නමැති ප්‍රමිතියෙන් තොර ප්‍රතිදේහ එන්නත් රජයේ රෝහල්වලට බෙදාහැරීම මගින් රුපියල් කෝටි ගණනක වංචා කිරීම සහ රෝගී ජීවිත අනාරක්ෂිත තත්ත්වයකට පත් කිරීම සම්බන්ධයෙන් විමර්ශන කරද්දී ගුද මාර්ගයේ හා මහ බඩවැලේ, පියයුරු, පෙණහලු, පොස්පෙට් ග්‍රන්ථිය, ආමාශය ආශ්‍රිත පිළිකා රෝගීන් සඳහා මෙන්ම ඇසේ දෘෂ්ඨි විතානය පැහැදිලි කිරීම සඳහා භාවිත කරන ඖෂධ මෙන්ම රුධිරය කැටි ගැසීමේ රෝගීන්ට දෙනු ලබන ඖෂධද ප්‍රමිතියෙන් තොර බව අනාවරණය වී ඇතැයි දැනුම් දෙමින් පැමිණිල්ල වෙනුවෙන් පෙනීසිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ලක්මිණී ගිරිහාගම මෙනවිය කළ ඉල්ලමකට අනුව රෝගීන්ගේ ජීවිත ආරක්ෂාව සඳහා අදාළ ඖෂධ යළි කැඳවීමට මහේස්ත්‍රාත්වරිය නියම කළාය.

පැමිණිල්ල කැඳවනු ලැබූ අවස්ථාවේදී සිද්ධියට අදාළව රිමාන්ඩ් භාරයට පත්කොට සිටින බාල ඖෂධ ගෙන් වූ බව කියන අයුසුලේට් බයෝටෙක් ෆාර්මා සමාගමේ හිමිකරු වන සුගත් ජනක ප්‍රනාන්දු මහතා වෛද්‍ය සැපයුම් අංශයේ අධ්‍යක්ෂ වෛද්‍ය කපිල වික්‍රමනායක මහතා එහි සහකාර අධ්‍යක්ෂ ශාන්තිනී සොලමන් මහත්මිය, ගණකධිකාරී (සැපයුම්) නෙරාන් ධනංජය සහ තොග පාලක සුජිත් කුමාර නමැති මහත්ම මහත්මීන් බන්ධනාගාර නිලධාරීන් විසින් අධිකරණයට ඉදිරිපත් කරන ලදී.

# අපේ ආණ්ඩුවක් යටතේ IMF සමග නව ගනුදෙනුවකට පිවිසෙනවා


## – විපක්ෂනායක සජිත් ප්‍රේමදාස

● දිනේෂ් සමරකෝන්

ඉදිරියේදී සිය ආණ්ඩුවක් යටතේ අයි.එම්.එෆ්. එකඟතාව නැවත සාකච්ඡාවට භාජනය කර නව ගනුදෙනුවකට පිවිසෙන බව විපක්ෂනායක සජිත් ප්‍රේමදාස මහතා පැවසීය.

පාර්ලිමේන්තුවේ ඊයේ (13දා) පැවති කාරක සභා අවස්ථාවේ විවාදයට එක්වෙමින් හෙතෙම මේ බව සඳහන් කළේය.

අයි.එම්.එෆ්. වැනි සංවිධාන පුද්ගලයන්ගේ මූණ දිහා බලා, ඔවුන් කතා කරන ඉංග්‍රීසි දිහා බලා සිය ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළ වෙනස් නොකරන බව ඊට ප්‍රතිචාර දක්වමින් අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා පැවසීය.



**විපක්ෂනායක සජිත් ප්‍රේමදාස** - අපි අයි.එම්.එෆ්. ඩීල් එකකට යනවා. අපි අයි.එම්.එෆ්. එකඟතාව නැවත සාකච්ඡාවට භාජනය කරලා ජනතාවගේ පැත්තෙන්, විශ්‍රාමික ජනතාවගේ අරමුදල්වලට පිටිපොකට් ගහන්නේ නැතිව, පොඩි මිනිහාගේ බඩට වදින්නේ නැති අයි.එම්.එෆ්. එකඟතාවකට අපි අනිවාර්යයෙන්ම යනවා.

**අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා** - අපේ විපක්ෂනායකතුමා කියන්නේ එතුමා ආවම මේක අයි.එම්.එෆ්. එක්ක කතා කරලා, ප්‍රතිව්‍යුහගත කරනවාලු. අයි. එම්.එෆ්. එක, ලෝක බැංකුව, අන්තර් ජාතික සංවිධාන පුද්ගලයන්ගේ මූණ දිහා බලල, ඒ අය කතා කරන ඉංග්‍රීසි දිහා බලලා තමන්ගේ ප්‍රතිපත්ති හා තමන්ගේ වැඩපිළිවෙළවල් වෙනස් කරන්නේ නෑ. එහෙම හිතනවා නම්, ඊට වඩා මොඩකමක් නෑ.

# නැගෙනහිර අතරමග නවතා ඇති මාර්ග ව්‍යාපෘති අවසන් කරන්න

## – ග්‍රාමීය මාර්ග රාජ්‍ය ඇමති පිල්ලෙයාන්ගෙන් නිලධාරීන්ට උපදෙස්

● සාකල්‍යා සඳමාලි



ආසියානු සංවර්ධන බැංකු ආධාර මත නැගෙනහිර පළාතෙහි ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ වැඩ ආරම්භ කර අතරමග නවතා ඇති ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති සියල්ල කඩිනමින් අවසන් කළ යුතු බව ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ශිවනේසතුරෛ චන්ද්‍රකාන්තන් මහතා පැවසීය.

අදාළ ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය සහ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී පැනනැගී ඇති ගැටලු නිරාකරණය කිරීම සම්බන්ධයෙන් ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ දී ඊයේ (12දා) පැවැති සාකච්ඡාවකදී හෙතෙම මේ බව පවසා සිටියේය.

අම්පාර, ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවල වැඩ ආරම්භ කර දැනට අතරමග නවතා ඇති ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන්ට ප්‍රමුඛතාව ලබා දී කඩිනමින් ඒවා අවසන් කිරීමට කටයුතු කරන ලෙසට ඒකාබද්ධ මාර්ග සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට රාජ්‍ය අමාත්‍යවරයා උපදෙස් ලබා දුන්නේය.

එමෙන්ම ඉදිකිරීම් අවසන් කර තිබෙන මාර්ගවල මාර්ග සංඥා පුවරු ස්ථාපිත කිරීම, මාර්ගවල සුදු ඉරි ඇඳීම, පදික මාරු ලකුණු කිරීම් යනාදි කටයුතු ද කඩිනම් කරන ලෙසට ව්‍යාපෘති ඉංජිනේරුවරයාට උපදෙස් ලබා දෙන ලදී.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ඩී.වීරසිංහ, කපිල අතුකෝරළ ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# 14 හැවිරිදි සිසුවිය අපයෝජනය කළ 24 හැවිරිදි තරුණයා අත්අඩංගුවට

● ජා-ඇල - තිස්ස කොටින්කඩුව

ජා-ඇල ප්‍රදේශයේ ප්‍රසිද්ධ බාලිකා විදුහලක 10 වසරේ ඉගෙනුම ලබමින් සිටි 14 හැවිරිදි පාසල් සිසුවියක අපයෝජනය කිරීමේ චෝදනාවට 24 හැවිරිදි මෝටර් රථ කාර්මිකයෙකු අත්අඩංගුවට ගත් බව ජා-ඇල පොලීසිය පවසයි.

තුඩැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු මෙසේ අත්අඩගුවට පත්ව ඇත. අදාළ සිසුවිය වෛද්‍ය පරීක්ෂණයක් සඳහා රාගම රෝහලට ඇතුළත් කොට තිබේ.

සිසුවියගේ මව පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ තම දියණිය ෆේස්බුක් මාර්ගයෙන් සැකකරු හඳුනාගෙන ඇති බවත් සිද්ධිය වූ දින රාත්‍රී 10.00 පමණ නිවෙසේ පිටතින් ඇති වැසිකිළියට යන බව පවසා නිවෙසින් බැහැරව සැකකරු සමග පැනගොස් ඇති බව සඳහන් කළ බව පොලීසිය පවසයි. සිද්ධිය සම්බන්ධයෙන් සිදු කළ වැඩිදුර පරීක්ෂණ කටයුතුවලදී හලාවත ප්‍රදේශයේ නිවෙසක සිටියෙදී සැකකරු හා සිසුවිය අත්අඩංගුවට ගැනීමට හැකිවු බව පොලීසිය සඳහන් කරයි.

# ඉංගිරියේ කර්මාන්තශාලාවකින් රු. 1,170,000ක භාණ්ඩ සොරාගත් 5ක් අත්අඩංගුවට

● ඉංගිරිය - නිමාලි කහවල

ඉංගිරිය, පැල්පිටිගොඩ ප්‍රදේශයේ විදුලි මෝටර් ආශ්‍රිත කටයුතු සිදු කෙරෙන කර්මාන්තශාලාවක් බිඳ එහි තිබූ එකොළොස් ලක්ෂ හැත්තෑ දහසක් වටිනා භාණ්ඩ තොගයක් සොරාගත් සහ ඒවා මිලට ගත් මල්ශාලාවක මෘතදේහ සකසන්නෙක් ඇතුළු පස්දෙනෙකු ඉංගිරිය පොලීසිය විසින් පෙරේදා (12දා) අත්අඩංගුවට ගනු ලැබ තිබේ.

පාදුක්ක, ගිරංචිකන්ද, මීගොඩ සහ ගලගෙදර ප්‍රදේශයන්හි පදිංචිකරුවෝ පස්දෙනෙක් මෙසේ අත්අඩංගුවට පත්ව සිටිති.

සොරාගත් භාණ්ඩ ප්‍රවාහනයට යොදාගත් ලොරි රථයද පොලිස් භාරයට ගෙන ඇත.

සැකකරුවන් විසින් සොරාගත් භාණ්ඩ ගැණුම්කරුවන් දෙදෙනෙකු හට විකුණා තිබියදී පොලීසිය විසින් සොයාගෙන ඇති අතර, මීගොඩ සහ ගලගෙදර ප්‍රදේශ වලින් අත්අඩංගුවට ගත් දෙදෙනා එලෙස සොර බඩු මිලට ගත් අය වෙති.

අනෙක් තිදෙනා අතර යකඩ බඩු එකතුකරන්නෙකු මෙන්ම මල්ශාලාවක මෘත දේහ සකසන්නෙකුද වන බව විමර්ශනවලදී අනාවරණය වී ඇත. ඔවුන් තිදෙනාම මත්කුඩු පානයට ඇබ්බැහිවූවන් බවද පොලීසිය පවසයි.

# වල්ලාපට්ට කිලෝ 17ක් සමග 2ක් දැලේ

● ප්‍රේමතිලක පෙරමුණ

වල්ලාපට්ට කිලෝ 17ක් ළඟ තබා ගෙන සිටි දෙදෙනෙකු පෙරේදා (12දා) වැලිපැන්න පොලිස් අපරාධ විමර්ශන අංශය සිදු කළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන ඇත

වැලිපැන්න මල්වතුකන්ද ප්‍රදේශයේ පදිංචි 42, 35 හැවිරිදි දෙදෙනෙක් මෙසේ අත්අඩංගුවට පත්ව සිටිති.

ඔවුන් දෙදෙනා සන්තකයේ අලෙවි කිරීම සඳහා සූදානම් කර තිබූ වල්ලාපට්ට කිලෝ 12 , 05 පොලිස් භාරයට ගෙන ඇත. වැලිපැන්න පොලිස් අපරාධ විමර්ශන අංශයට ලද තොරතුරකට අනුව වැටලීම සිදු කර සැකකරුවන් අත්අඩංගුවට ගෙන තිබිණි. මොවුන් කාලයක් තිස්සේ මෙම ජාවාරම සිදු කරගෙන ගොස් ඇති බවට අනාවරණය වී ඇතැයි පොලීසිය පවසයි. වැලිපැන්න පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සිදු කරයි.

# කහවත්තේ නිවසකදී තිදරු මවක ඝාතනය කරලා

● කහවත්ත - ලසන්ත නිරෝෂණ පෙරේරා

කහවත්ත, වැල්ලඳුර වෙලේවත්ත නිවසක වයසක කාන්තාවක ඊයේ (13දා) තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බව කහවත්ත පොලීසිය පවසයි.

මෙලෙස ජීවිතක්ෂයට පත්ව ඇත්තේ, එම ප්‍රදේශයේ පදිංචිව සිටි තිදරු මවක වන ජේ.එම්. විනීතා ජයසුන්දර (අවු.71) නමැත්තියකි.

නිවසේ දියණිය සමග ජීවත්ව ඇති මරණකාරිය දියණිය රැකියාවට ගොස් සවස නිවසට පැමිණි පසු මව නිවස පිටිපසු ඇදවැටී සිටිනු දැක ඒ සම්බන්ධයෙන් පොලීසිය දැනුවත් කර තිබුණි. සොරකමක් කිරීමට පැමිණි අයෙකු හෝ කණ්ඩායමක් විසින් මෙම ඝාතනය සිදු කරන්නට ඇතැයි පොලීසිය සැක කරයි.

ඝාතනය කෙරුණු 71හැවිරිදි මවගේ පුතෙක් ගුවන් විදුලියේ මාධ්‍යවේදියෙකු ලෙස සේවය කරන අතර, දියණියක් වෛද්‍යවරියක් වන බවත්, නිවසේ සිටි දියණිය කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන්නියක බවද පොලීසිය වැඩිදුරටත් පවසයි.

සිද්ධිය සම්බන්ධයෙන් කහවත්ත පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාරත්න මහතා ඇතුළු නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# වෑන් රථයක ගැටීමෙන් පුද්ගලයෙක් මරුට

● මත්තේගොඩ ශාන්ත ප්‍රදීප් කුමාර කුලරත්න

හොරණ කොළඹ බස් මාර්ගයේ පොල්ගස්ඕවිට හන්දිය ආසන්නයේ පාර මාරු වෙමින් සිටි පුද්ගලයෙකු මාර්ගයේ ධාවනය වූ වෑන් රථයක ගැටීමෙන් සිදුවූ අනතුරින් මියගොස් ඇතැයි කැස්බෑව පොලීසිය සඳහන් කරයි.

දෙහිඕවිට, අටලුගම පදිංචි නිමල් අබේසිරි (47) නමැත්තෙකු මෙසේ ජීවිතක්ෂයට පත්ව ඇත.

මෙම පුද්ගලයා පෙරේදා (12දා) රාත්‍රියේ හල්පිට රට බීම හල අසලින් පාර මාරු වීමට යාමේදී කොළඹ දෙස සිට හොරණ දෙසට අධික වේගයෙන් ධාවනය වූ වෑන් රථයක ගැටී අනතුරට ලක්ව තිබිණි. අනතුරින් බරපතළ තුවාල ලැබූ ඔහු වෑ අතර දියාරෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව මියගොස් තිබූ බව පොලීසිය කියයි. රිය අනතුර සිදු කළ වෑන් රථ රියැදුරා හා අදාළ වෑන් රථය පොලිස් භාරයට ගනු ලැබ තිබේ.

# බදු අය කර ගන්නා ලෙස ඉල්ලන සත්‍යග්‍රහය අද

● ඉන්දික හේවාවිතාරණ

ජනතාව මත තවත් බර පැටවීම නවතා මහා පරිමාණ බදු පැහැර හැරියවුන්ගෙන් වහා බදු අයකරගනු! ලෙස ඉල්ලා අද (14දා) දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව ඉදිරිපිට සත්‍යග්‍රහ ව්‍යාපාරයක් පවත්වන බව ආර්ථික යුක්තිය උදෙසා ජනතා සාමූහිකය සඳහන් කරයි.

මීට අමතරව දේශීය ආදායම් කොමසාරිස් තනතුරු පුරප්පාඩු වී මාස ගණනාවක් ගත වී තිබෙන බවත්, මෙම තනතුර කඩිනමින් සම්පූර්ණ කළ යුතු බවත් පෙන්වාදෙයි.

එක් දින සංකේත සත්‍යග්‍රහයට සමගාමීව අදාළ ඉල්ලීම් ඉටුකරන ලෙස ඉල්ලා අත්සන් දස ලක්ෂයක මහජන පෙත්සම රජයට භාර දීමට කටයුතු කරන බවද එම සාමූහිකය පෙන්වා දෙයි.

මීට අදාළ අත්සන් ලබා ගැනීමත් අද දිනයේදී ආරම්භ කරන බවත්, සත්‍යග්‍රහය උදේ 09.00 සවස . 05.00 දක්වා පැවැත්වෙන බවත් මේ සඳහා සිවිල්, බහුජන සංවිධාන හා පක්ෂවල නියෝජිතයන් සම්බන්ධ වන බවත් සඳහන් කරයි.

# විමල්ට එරෙහි අල්ලස් නඩුවේ නඩු විභාග සම්මන්ත්‍රණය ජනවාරි 29දා

● බුද්ධිමාල් රූබේරු

වසර 10ක කාලයක් තුළ සිය නීත්‍යානුකූල ආදායම් හා වත්කම්වලින් උපයාගත නොහැකි වූ රුපියල් මිලියන 75කට අධික මුදල් හා වත්කම් උපයාගත් බවට හිටපු අමාත්‍ය විමල් වීරවංශ මහතාට එරෙහිව අල්ලස් කොමිසම පැවරූ නඩුව පවත්වාගෙන යෑමට නොහැකි බවට විමල් වීරවංශ මහතා වෙනුවෙන් ඉදිරිපත් කළ මූලික විරෝධතා දෙකම ප්‍රතික්ෂේප කළ කොළඹ මහාධිකරණ විනිසුරු නවරත්න මාරසිංහ මහතා පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය ලබන වසරේ ජනවාරි 29 දා පැවැත්වීමට ඊයේ (13දා) තීරණය කළේය.

2009 ජනවාරි මස පළමුවැනිදාත් 2014 වසරේ දෙසැම්බර් මස 31 දාත් අතර කාලසීමාව තුළ අමාත්‍යවරයෙකු වශයෙන් කටයුතු කරමින් සිය නීත්‍යානුකූල ආදායමට වඩා රුපියල් මිලියන 75කට අධික මුදල් සහ වත්කම් උපයා ගත් බවට යහපාලන රජය සමයේ හිටපු අමාත්‍ය විමල් වීරවංශට මහතාට එරෙහිව අල්ලස් කොමිසම චෝදනා නගා ඇත.

ආදායම අබිබවා රුපියල් මිලියන 75 කට අධික වත්කම් සහ මුදල් අත්පත් කර ගැනීමෙන් අල්ලස් පනතේ විග්‍රහ කෙරෙන 'දූෂණය' නමින් හඳුන්වන අල්ලස් පනත යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කොට ඇති බවද අල්ලස් කොමිසම දැනුම් දී ඇත.

වසර 10ක කාලයක් තුළ සිය නීත්‍යානුකූල ආදායම් හා වත්කම්වලින් උපයාගත නොහැකි වූ රුපියල් මිලියන 75කට අධික මුදල් හා වත්කම් උපයාගත් බවට හිටපු අමාත්‍ය විමල් වීරවංශ මහතාට එරෙහි නඩුව කැඳවනු ලැබූ අවස්ථාවේදී විමල් වීරවංශ මහතා අධිකරණයේ පෙනී සිටියේය.

මෙම නඩුව පවත්වාගෙන යෑමට නොහැකි බවට විමල් වීරවංශ මහතා වෙනුවෙන් ඉදිරිපත් කළ මූලික විරෝධතා දෙකම ප්‍රතික්ෂේප කරමින් පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය පැවැත්වීමට තීරණය කළ විනිසුරුවරයා නඩුව ලබන වසරේ ජනවාරි 29වැනිදා කැඳවීමට නියම කළේය.

# උපකාරක පංතියට ගොස් නිවස කරා පැමිණෙමින් සිටි දියණියව මවට පහරදී පැහැරගෙන ගිහින්

● බුලත්සිංහල - සුමති කුඩලිගම

දියණිය පෞද්ගලික උපකාරක පංතියකට ගොස් තමා සමග නිවස කරා පැමිණෙමින් සිටියදී දියණියගේ පෙම්වතා තමාටද පහරදී 17 හැවිරිදි දියණියව පැහැරගත් බවට මවක් ඊයේ (13දා) සවස පැමිණිල්ලක් මත පරීක්ෂණ ආරම්භ කළ බව මතුගම පොලීසිය පවසයි.

සිසුවිය හොරණ ප්‍රදේශයේ පාසලක ඉගෙනුම ලබන බවත්, ඇය සමග මතුගම ප්‍රදේශයේ පෞද්ගලික උපකාරක පංතියකට ගොස් එමින් සිටියදී තවත් පුද්ගලයෙකු සමග ත්‍රිරෝද රථයකින් පැමිණි සැකකරු දියණියගේ අතින් ඇද ත්‍රිරෝද රථයට නංවාගෙන ඇති බවට මතුගම යටදොළවත්ත ප්‍රදේශයේ පදිංචි 44 හැවිරිදි කාන්තාවක සිදුකළ පැමිණිල්ලේ සඳහන් වේ.

එම අවස්ථාවේ පැමිණිලිකාරිය ද ත්‍රිරෝද රථයට නැගීමට උත්සාහ දරා ඇති අතර, සැකකරු ඇයට පා පහරක් එල්ල කර තර්ජනය කර පලාගොස් ඇති බවද පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් වේ.

සැකකරු සහ පැහැරගැනීමට යොදාගත් ත්‍රිරෝද රථයද හඳුනාගෙන ඇති බවත් කඩිනමින් අත්අඩංගුවට ගැනීමට ක්‍රියාකරන බවත් පොලිසිය කීය.

සිද්ධිය සම්බන්ධයෙන් මතුගම මූලස්ථාන පොලිස් පරීක්ෂක පරාක්‍රම උඩවත්ත මහතාගේ උපදෙස් පරිදි අපරාධ අංශ නිලධාරීහු වැඩිදුර පරීක්ෂණ පවත්වති.

# අයිස් සමග සැකකරුවෙක් දැලේ

● බණ්ඩාරගම - බිමල් ශ්‍යාමන් ජයසිංහ

ඝාතනයට ලක් වූ පාතාල නායකයකු වන සොත්ති උපාලි නමැත්තාගේ පුත්‍රයා රුපියල් ලක්ෂ 3කට අධික වටිනා අයිස් මත්ද්‍රව්‍ය තොගයක් සමග අත්අඩංගුවට ගත් බව බොරැල්ල පොලීසිය සඳහන් කරයි.

බොරැල්ල ගජබා පාර පදිංචි 38 හැවිරිදි පුද්ගලයෙක් මෙසේ අත්අඩංගුවට පත්ව ඇත.

සැකකරු සමඟ අයිස් මත්ද්‍රව්‍ය මිලිගෑම් 14770ක්ද පොලිස් භාරයට ගෙන ඇත.

බොරැල්ල පොලිසියේ අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් බොරැල්ල පොලිස් වසමේ සංචාරයේ යෙදී සිටියදී සැකකරු බොරැල්ල මතා පාර රේල් පාර අසලදී පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී අයිස් මත්ද්‍රව්‍ය පැකට්ටුව හමු වූ බව පොලීසිය පවසයි.

# අයහපත් කාලගුණයෙන් කළුතර පුද්ගලයන් 86ක් පීඩාවට





● පානදුර සුමිත් පොතුපිටිය /බෙන්තොට ජේ.ඉඳුරුවගේ/බද්දේගම - සරත් ආනන්ද/ බුලත්සිංහල - සුමති කුඩලිගම

කළුතර දිස්ත්‍රික්කයේ මතුගම, පාලින්දනුවර, බේරුවල සහ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට බලපෑ ගංවතුර, නායයෑම්, තද සුළං සහ අකුණු ගැසීම්වලින් ග්‍රාම නිලධාරී වසම් 13ක පවුල් 22කට අයත් පුද්ගලයන් 86දෙනෙකු පීඩාවට පත්ව නිවාස 17ක් අර්ධ හා සුළු හානිවලට ලක්ව ඇති බව ආපදා කළමනාකරණ ඒකකයේ කළුතර දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ ලුතිනන් කර්නල් ප්‍රශාන්ත පෙරේරා මහතා පැවසීය.

නොකඩවා ඇදහැලෙන දැඩි වර්ෂාවෙන් කළුතර දිස්ත්‍රික්කයේ කළුගඟ කුඩා ද්‍රෝණියේ ඉහළ ධාරා ප්‍රදේශ ආශ්‍රිතව ඉහළ වර්ෂාපතනයක් ලැබීමෙන් බුලත්සිංහල, පාලින්දනුවර සහ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි මාර්ග රැසක් හා පහත් බිම් තවමත් ජලයෙන් යටවී පවතින බවද ඒ මහතා පැවසීය.

ඒ අනුව පාලින්දනුවර ලත්පඳුර-ඉලුක්පොත, බදුරලිය -කලවාන, බදුරලිය-පැනිගල, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුලත්සිංහල-මෝල්කාව, දඹල-ඉහළ වෙල්ගම, බුලත්සිංහල - කල්ලුමලේ, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වලල්ලාවිට - අවිත්තාව ආදී මාර්ග හා ඒ අවට පහත් බිම් අඩි 1.5 සිට අඩි 8 දක්වා තරම් උසට ජලයෙන් යටවී ඇතැයි ඒ මහතා සඳහන් කළේය.

මේ තත්ත්වය සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඊයේ (13දා) පස්වරු 6.45 දක්වා බලපැවැත්වෙන පරිදි නිකුත් කළ ගංවතුර නිවේදනය අනුව මෙම ප්‍රදේශවලට සුළු ගං වතුර තත්ත්වයක් ඇතිවන බවට අනතුරු අඟවා තිබේ.

